CCT CENTRE FOR COMBATING TOBACCO

CENTRE FOR COMBATING TOBACCO
Faculty of Medicine, University of Colombo
40/18, Park Road, Colombo 5, Sri Lanka
Tel:+94 112 599 852, +94112581571
Fax: +94112581572
Email: tobaccounmasked@gmail.com
Web: www.cct.lk / www.tobaccounmasked.lk

# දුම්කොළ කර්මාන්තයේ උපක්‍රමයන්ගෙන් තරුණ පිරිස බේරා ගැන්ම සහ දුම්කොළ හා නිකොටින් භාවිතයෙන් ඔවුන් වළක්වා ගැනීම: ලෝක දුම්කොළ විරෝධී දිනය 2020 මැයි 31

ලෝක දුම්කොළ වසංගතය හේතුවෙන් වාර්ෂිකව මිය යන මිලියන 8 ක ජනතාව කෙරෙහි අවධානය යොමු කිරීම සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) විසින් 1987 දී ආරම්භ කිරීමට යෙදුණු ලෝක දුම්කොළ විරෝධී දිනය සෑම වසරකම මැයි 31 වන දින සමරනු ලැබෙයි. දුම්කොළ නිෂ්පාදන අලෙවියේ දී තරුණ ප්‍රජාව කර්මාන්තයේ ප්‍රධාන ඉලක්කයක් වන බැවින් "දුම්කොළ කර්මාන්තයේ උපක්‍රමයන්ගෙන් තරුණ පිරිස බේරා ගැන්ම සහ දුම්කොළ හා නිකොටින් භාවිතයෙන් ඔවුන් වළක්වා ගැනීම" යන තේමාව යටතේ තරුණයින් ආරක්ෂා කිරීම කෙරෙහි මෙම වසරේ දී අවධානය යොමු කෙරෙයි.

ශ්‍රී ලංකාව 2003 වසරේ දී ලෝක සෞඛ්‍ය සංවිධානයේ දුම්කොළ පාලනය පිළිබඳ නීතිමය රාමුව (FCTC) ට අත්සන් තැබූවේ එසේ කරන ලද කලාපයේ ප්‍රථම රට බවට පත් වෙමිනි. FCTC හි 13 වන වගන්තිය සහ 16 වන වගන්තිය මගින් සියලු ආකාර වල දුම්කොළ ප්‍රචාරක දැන්වීම්, ප්‍රවර්ධන සහ අනුග්‍රාහකත්ව තහනම් කිරීමට සහ ළමුන්ට දුම්කොළ නිෂ්පාදන විකිණීම වැළැකීමට පියවර නිර්දේශ කරයි. දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරී (NATA) පනත මගින් සියලු ආකාරයේ දුම්කොළ ප්‍රචාරක දැන්වීම්, ප්‍රවර්ධන සහ අනුග්‍රාහකත්ව තහනම් කරන අතර වයස අවුරුදු 21 ට අඩු ඕනෑම අයෙකුට දුම්කොළ නිෂ්පාදන අලෙවියද ඒ අනුව තහනම් වෙයි.

සිය පාරිභෝගිකයින්ගෙන් අඩක්, සංඛ්‍යාත්මකව ගත් විට ශ්‍රී ලංකාවේ වසරකට 20,000 ක් පමණ සහ ලොව පුරා මිලියන 8 කට වැඩි ජනතාවක් සෑම වසරකම අකාලයේ මරා දැමීමට දුම්කොළ නිෂ්පාදන සමත් වෙයි. දුම්කොළ කර්මාන්තය ලාභ අපේක්ෂා කරන ව්‍යාපාරයක් ලෙස ඔවුන්ගේ පැවැත්ම සහ ලාභය සහතික වීම සඳහා වැඩි වැඩියෙන් නව පාරිභෝගිකයින් බඳවා ගැනීම අවශ්‍ය වෙයි. දුම්කොළ කර්මාන්තය විසින් ළමුන් සහ තරුණයින් ආකර්ෂණය කර ගැනීම සඳහා සෘජු හා වක්‍ර වෙළඳ ප්‍රචාරක දැන්වීම්, අනුග්‍රාහකත්ව ලබා දීම, විවිධ රසයන්ගෙන් යුත් නිෂ්පාදන හඳුන්වා දීම, චිත්‍රපට, ටෙලි නාට්‍ය හා සමාජ මාධ්‍ය වල සන්නාම සහිත හෝ රහිත නිෂ්පාදන ස්ථානගත කිරීම වැනි පුළුල් පරාසයක උපක්‍රම යොදා ගනියි. එසේම මහජනතාව රැස්වන ස්ථාන හා අවස්ථාවල දී සිගරට් නොමිලයේ බෙදා හැරීම වැනි උපක්‍රමද භාවිතා කරන බවට සාක්ෂි අනාවරණය වී ඇත.

දුම්කොළ කර්මාන්ත අධ්‍යයන කේන්ද්‍රය (CCT) යනු ශ්‍රී ලංකාවේ සහ දකුණු ආසියානු කලාපයේ දුම්කොළ නිරීක්ෂණාගාරය වන අතර එය මහජන සෞඛ්‍යයට බලපාන දුම්කොළ කර්මාන්තයේ මැදිහත්වීම් සහ ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම සඳහා FCTC හි 5.3 වගන්තිය යටතේ පිහිටුවා ඇත. ඔබ කැමති ඕනෑම භාෂාවකින් දුම්කොළ කර්මාන්තයේ මැදිහත්වීම් සහ ක්‍රියාකාරකම් වාර්තා කිරීමට ඔබට අවස්ථාව ලබා දී ඇති *TobaccoUnmasked HotSpots* ජංගම යෙදුම සහ Map වෙබ් අඩවියෙන් සමන්විත අපගේ ප්‍රජා මූලික දුම්කොළ ආවේක්ෂණ පද්ධතිය (CDTSS) නිසා සමස්ත ශ්‍රී ලංකාවාසීන්ට එහි කොටස්කරුවන් වීමට අවස්ථාව එළැඹී ඇත.

විවිධ උපක්‍රම මගින් තරුණයින් ඉලක්ක කර ගැනීම ඇතුළු එවැනි සිදුවීම් ඔබට දැන ගැනීමට ලැබුන හොත්, ඔබට එය *TU HotSpots* ජංගම යෙදුම හරහා වාර්තා කළ හැකිය. එය නොමිලයේ බාගත හැකි අතර සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම ලබා ගත හැකිය. ඊට අමතරව, ඔබට සෘජුවම tobaccounmaske@gmail.com විද්‍යුත් තැපැල් ලිපිනය හරහා සෘජු වෙත තොරතුරු ලබා දිය හැකිය. එසේම www.cct.lk වෙබ් අඩවියේ "Contact Us" පිටුව හරහා ඔබගේ අනන්‍යතාවය හෙළි නොකරම එසේ අප වෙත තොරතුරු ලබා දිය හැකිය.

අපගේ ගවේෂණාත්මක පර්යේෂණ සහ CDTSS හරහා වාර්තා අනුව බිහිවෙන ශ්‍රී ලංකාවේ සහ දකුණු ආසියානු කලාපයේ දුම්කොළ කර්මාන්තයේ මැදිහත්වීම් සහ ක්‍රියාකාරකම් පිළිබඳ පුළුල් තොරතුරු එකතුව අපගේ *TobaccoUnmasked* ([www.tobaccounmasked.lk](http://www.tobaccounmasked.lk)) සහ *TobaccoUnmaseedSouth.Asia* ([www.tobaccounmaskedsouth.asia](http://www.tobaccounmaskedsouth.asia)) යන තොරතුරු ද්වාරවල ඔබගේ පහසු පරිහරණය සඳහා සවිස්තරාත්මක ව දක්වා ඇත.

2020 වසරේ ලෝක දුම්වැටි විරෝධී දිනය සැමරීම සඳහා එළැඹෙන කාලයේදී, CCT සමග එහි කලාපීය දුම්කොළ නිරීක්ෂණාගාර ජාලය වන දකුණු ආසියානු කලාපීය දුම්කොළ කර්මාන්ත අධ්‍යයන කේන්ද්‍රය (SARC-CCT) එක්ව ක්ෂය රෝගයට හා පෙනහළු රෝගවලට එරෙහි ජාත්‍යන්තර සංගමය (The Union) සමඟ සහයෝගයෙන්, ජාත්‍යන්තර වෙබ් සම්මන්ත්‍රණ (Webinar) මාලාවක් සංවිධානය කර ඇත. කලාපයේ තරුණයින් ඉලක්ක කර ගත් දුම්කොළ කර්මාන්තයේ උපක්‍රම අනාවරණය කිරීම (#ExposeTobacco) සහ ඒවා වැළැක්වීමට ගත හැකි අදාළ උපායමාර්ග සහ එහිදී ලත් ජයග්‍රහණ බෙදා හදා ගැනීම මෙම වෙබ් සම්මන්ත්‍රණ මාලාවේ අරමුණයි.

ඔබගේ නිපුණතා වැඩි දියුණු කර ගැනීම සඳහා මෙම වෙබ් සම්මන්ත්‍රණ මාලාවට (කාලසටහන මේ සමග අමුණා ඇත) සම්බන්ධ වනු ඇතැයි බලාපොරොත්තු වෙමු. එවිට, ශ්‍රී ලංකාවේ සහ දකුණු ආසියානු කලාපයේ දුම්කොළ මර්දනය කිරීමට සහ තරුණ පරම්පරාව දුම්කොළ හා ඒ ආශ්‍රිත හානිවලින් ආරක්ෂා කර ගැනීම සඳහා ඔබට වඩාත් ඵලදායී පියවර ගත හැකි වනවා මෙන් ම අප සමඟ අත්වැල් බැඳ ගැනීමට ද හැකි වෙයි.

CCT කණ්ඩායම
2020 මැයි 31